**Gazette of the Democratic Socialist Republic of Sri Lanka**

**Extraordinary**

No. – Thursday, May , 2025 – 2025.05.22

(Published by the Authority of the Government)

**SPORTS LAW, NO. 25 OF 1973**

**Regulations Made By The Minister Of Youth Affairs And Sports Under The Section 32 And 33 Of Sports Law No. 25 Of 1973**

I, Sunil Kumara Gamage, Minister of Youth Affairs and Sports, vary the Extraordinary Gazette Notification bearing No. 2386/08 published on 29th May 2024 as follows;

1. I temporarily suspend the registration of Sri Lanka Rugby by virtue of the powers vested in me under Section 32 and 33 of the Sports Law No. No. 25 of 1973 and its amendments.

2. I hereby revoke with immediate effect, the appointment of Prof. (Rear Admiral) Shemal Fernando, the Director General of the Department of Sports Development as the Competent Authority for Sri Lanka Rugby made by the said Extraordinary Gazette Notification bearing No. 2386/08 published on 29th May 2024.

3. By virtue of the power vested in me under Section 33 of the Sports Law No. 25 of 1973 and its amendments, I hereby appoint a **WORKING TASK FORCE** consisting of the following members for the limited purpose of amending the Constitution of Sri Lanka Rugby as recommended by the Constitutional Review Group appointed by the World Rugby, and agreed upon by all the stakeholders, and which was published along with the notice issued by the Director General of Sports (Competent Authority) of Sri Lanka Rugby No. DSD/NSA/COM/01/2024 dated 24.06.2024.

1. **Mr. M. R. Latiff, Senior Deputy Inspector General of Police (Rtd.) - Chairman**
2. **Mr. Suresh Subramaniam, Chairman, National Olympic Committee**
3. **Mr. Priyantha Ekanayake, Chairman, National Sports Council**
4. **Mr. Dinal Phillips, President's Counsel**
5. **Mr. Rohan Abayakoon, Member, National Sports Council**

4. An election shall be held to elect office bearers within a period of 90 days after the registration of the new Constitution in terms of the Sports Law No. 25 of 1973 and its amendments, and the Regulations promulgated thereunder.

5. I hereby authorize the Working Task Force to manage the affairs of Sri Lanka Rugby until the office bearers are elected at an Annual General Meeting held under the new Constitution of Sri Lanka Rugby.

6. Save and except for the matters stated above, all other matters stated in the Extraordinary Gazette Notification bearing No. 2386/08 published on 29th May 2024 shall remain to be in force.

**Sunil Kumara Gamage (M.P.)**
Minister of Youth Affairs and Sports

on this 22nd day of May, 2025, at Colombo.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

| | |
|---|---|
| අංක | – 2025 මැයි මස 22 වැනි බදාදා - 2025. 05. 22 |

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## 1 වැනි කොටස : (1) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 සහ 33 වගන්ති අනුව තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග**

තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය සුනිල් කුමාර ගමගේ වන මම, 2024 මැයි මස 29 වැනි දින ප්‍රකාශයට පත්කරනු ලැබූ විශේෂ ගැසට් නිවේදන අංක 2386/08 යටතේ දැක්වෙන කරුණු පහත පරිදි වෙනස් කරමි;

1. මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සහ එහි සංශෝධන අනුව 32 සහ 33 වගන්ති යටතේ මා වෙත පවරා ඇති බලතල මත ප්‍රකාරව, ශ්‍රී ලංකා රග්බි සංගමයෙහි ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවමි.

2. මම, ඉහත කී 2024 මැයි මස 29 වැනි දින සහ අංක 2386/08 දරන විශේෂ ගැසට් නිවේදනය යටතේ ශ්‍රී ලංකා රග්බි සංගමය සඳහා සුදුසු බලධාරියෙකු වශයෙන් පත්කරන ලද **ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය (රියර් අද්මිරාල්) ෂෙමල් ප්‍රනාන්දු** මහතාගේ පත්වීම, වහාම බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි.

3. 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සහ එහි සංශෝධන අනුව 33 වගන්තිය යටතේ මා වෙත පවරා ඇති බලතල මත ප්‍රකාරව, මම ලෝක රග්බි විසින් පත්කරන ලද ව්‍යවස්ථා සමාලෝචන සමූහය විසින් යෝජනා කරන ලද සහ සියලුම පාර්ශවකරුවන්ගේ එකඟතාවය ලබා දුන්, ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද දැනුම්දීම (ලේඛන අංකය: DSD/NSA/COM/01/2024, දිනය: 2024.06.24) මඟින් ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා රග්බි **ව්‍යවස්ථාව වෙනස් කිරීම සඳහා පමණක් සීමාකළ ක්‍රියාකරි කාර්ය බලකායක් (Working Task Force)** පත් කරමි. එම කමිටුවේ සාමාජිකයන් පහත පරිදි වේ:

1. විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති එම්. ආර්. ලතීෆ් මහතා - සභාපති
2. ජාතික ඔලිම්පික් කමිටුවේ සභාපති සුරේෂ් සුබ්‍රමණියම් මහතා
3. ජාතික ක්‍රීඩා සභාවේ සභාපති ප්‍රියන්ත ඒකනායක මහතා
4. ජනාධිපති නීතිඥ ඩිනාල් ෆිලිප්ස් මහතා
5. ජාතික ක්‍රීඩා සභාවේ සාමාජික රොහාන් අභයකෝන් මහතා

4. 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සහ එහි සංශෝධන අනුව සහ ඒ යටතේ නිකුත් කරන ලද විධිවිධාන අනුව නව ව්‍යවස්ථාව ලියාපදිංචි කිරීමෙන් දින 90ක් ඇතුළත නව නිලධාරීන් පත්කර ගැනීම සඳහා නිලවරණය පවත්වනු ලැබිය යුතුය.

5. මම මෙයින්, ශ්‍රී ලංකා රග්බි සංගමය නව ව්‍යවස්ථාව යටතේ පැවැත්වෙන වාර්ෂික මහ සභා රැස්වීමකදී සිය නිලධාරීන් තෝරා පත්කරගන්නා තෙක්, ශ්‍රී ලංකා රග්බි සංගමයේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා, ඉහත කී **ක්‍රියාකරි කාර්ය බලකාය (Working Task Force)** වෙත බලය පවරා දෙමි.

6. ඉහත සඳහන් කරුණු හැර, ඉහත කී 2024 මැයි මස 29 වැනි දින සහ අංක 2386/08 දරන විශේෂ ගැසට් නිවේදනයෙහි ප්‍රකාශයට පත් කෙරුණු අනෙකුත් සියලු ව්‍යවස්ථානුකූල නියෝග සහ තීරණ බලාත්මක වේ.

**සුනිල් කුමාර ගමගේ, (පා. ම. )**
තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය

2025 මැයි මස 22 වැනි දින, කොළඹදී.